
# අරුම පුදුම කඟවේනා



රනුදි රමල්යා හේරත්

# අරුම පුදුම කඟවේනා

**2023**

**කතෘ ප්‍රකාශනයකි**

ISBN : 978-624-206-761-2



**කථාව සහ චිත්‍ර - එච්.එම්.රනුදි රමල්‍යා බණ්ඩාර හේරත්**

**පාසල - මහාමායා බාලිකා විද්‍යාලය , මහනුවර**

**කතෘගේ වෙනත් කෘති - අසරණ ගැහැණු ළමයා**

**2023.10.22**

# පිදුම

මගේ උතුම් පාසල

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ

මාගේ ආදරණීය විදුහල්පතිනියට

සහ

මාගේ ගෞරවණීය පන්තිභාර ගුරු මැණියන් වන

චාමිණී පල්ලියගුරු ගුරුමැණියන්ට......



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුතු බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්තකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක්වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතිකඅවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික ස්මාට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි දරුවන්ගේ අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතටය එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන් මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20

එකෝමත් එක කාලයක ලස්සන කඟවේනෙක් සිටියා.



මේ කඟවේනාට තිබුණා අරුම පුදුම බලයක්.එත් ඉතින් එයාට යාළුවෝ සිටියේ නෑ..

ඉතින් එයා දුක් වුණා.

ඔන්න ඔහොම කාලයක් ගත වෙද්දි එයාට යාළුවෙක් හම්බවුණා.

එයාට හරිම සතුටුයි...

ඒ දෙන්නා ඉක්මනට යාළුවෝ වුණා.




ඉතින් ඔයාලා දන්නවද ඒ කවුද කියලා.....ඒ ලස්සන හා පැංචෙක්.

ඔහොම කාලයක් ගත වෙනකොට එක දවසක් කඟවේනයි හා පැංචයි ගමනක් යන්න තීරණය කළා.



ඒ කැලෑවේ ලස්සන බලන්න.

ඔහොම ඇවිදගෙන යනකොට නපුරු වලහෙක් එයාලා යන පාර මැද්දට පැන්නා.



මේ වලහා හා පැංචටයි කඟවේනටයි පහර දෙන්න සූදානම් වුණා.



මේ දෙන්නා හොඳටම බය වුණා...

එතකොටම කඟවේනට එයාගේ අරුම පුදුම බලය මතක් වුණා..කඟවේනා එයාගේ පියාපත් විහිදුවා.



එයා වලහා කැලෑවෙන් එලවා දැම්මා.

යාළුවාගේ මේ අරුම පුදුම බලය ගැන හා පැංචට හරිම සතුටුයි.

ඊට පස්සේ කැලෑවේ සතුන් හැමෝටම තේරුණා කඟවේනා හරිම හොඳ සතෙක් බව.

# කඟවේනාගේ බලයෙන් කැලෑවේ සතුන් හැමෝම සතුරන්ගෙන් බේරා ගත්තා...



ඔයාලා දන්නවද

කොහොමෙයි

හා පැංචගෙයි

නම් මොනවද කියලා...

හා පැංචා ලිනෝ් කොහොමෙනා

ලියෝ්නා.

ලිනෝ්ටයි ලියෝ්නටයි තව

ගොඩාක් යාළුවෝ් හමුවුණා.

එයාලා ලස්සන

වනාන්තරයකට ගියා.

# ලස්සන ලස්සන ගෙවල් හදාගත්තා.එයාලා ගොඩක් සතුටින් සමඟියෙන් ජීවත් වුණා.



නිමි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔපනැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 දි මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි.ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මයාමායා පුංචි ගත්කතුවරියන්ය.පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා  එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මන දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකීයාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශණය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්න සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන  නිසා ප්‍රතිපත්ති සම්පදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහාලේකම්
පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20

ISBN: 978-624-206-761-2